# ශෝකජනක නාට්‍ය සංකල්පය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

**හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්**
**ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය**
***bihesh@gmail.com***

ශෝකය මුඛ්‍ය රසය කොට ගනිමින් ඉදිරිපත් කෙරෙන නාට්‍ය *"ශෝකජනක"* නම් වේ. ක්‍රිස්තු පූර්ව අවධියේ සිට පැවත එන ශෝකජනක නාට්‍ය කලාවක් දැකගත හැකි වේ. ප්‍රධාන සම්ප්‍රදාය කිහිපයකට සම්බන්ධ ශෝකජනක නාට්‍ය සංකල්ප පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට මෙහිදී අපේක්ෂිතය.

මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සොෆොක්ලීස්, සෙනෙකා, විලියම් ශේක්ෂ්පියර්, තෝමස් කයිඩ්, හෙන්රික් ඉබ්සන්, භවභූති, චිකමත්සු මොන්සයිමොන්, *කනකරාජ අයියර්,* එදිරිවීර සරච්චන්ද්‍ර වන් නාට්‍යකරුවන්ගේ නාට්‍ය කෘති හා *නාට්‍යශාස්ත්‍රය, කාව්‍යශාස්ත්‍රය* වැනි විචාර ග්‍රන්ථ අධ්‍යයනය කෙරේ. ද්වෛතීයික මූලාශ්‍රය වශයෙන් ඒ පිළිබඳ මෑතකාලීන විද්වතුන් විසින් දක්වන ලද මතවාද ඇතුළත් විචාර ග්‍රන්ථ අධ්‍යයනය කෙරේ.

මෙම පර්යේෂණයට අනුව ශෝකජනක නාට්‍ය සංකල්ප අතර සමාන-අසමානතා පිළිබඳවත් එසේ වීමට බලපෑ හේතු සාධක පිළිබඳවත් සංසන්දනාත්මක ව විමසා බැලීමට අවස්ථාව උදා වනු ඇත.

ග්‍රීක ශෝකජනකයක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ අතර කථානායකයන් ප්‍රභුවරුන් වීම අත්වැරැද්දක් වැනි කරුණක් මත එම චරිතවල ඇදවැටීම සිදුවීම හා ඒ හේතුවෙන් ප්‍රේක්ෂකයා තුළ *කාරුණ්‍යයක් හා භයක්* ජනිත කරවීම ප්‍රධාන වේ. මිනීමැරුම්, දිවිනසාගැනීම් වැනි දර්ශන එවායේ නොදැක්වෙතත් ඒ ආශ්‍රය කොට ගනිමින් බිහි වූ *රෝම ශෝකජනක* එබඳු බැරෑරුම් පසුබිමක් තුළ දිගහැරෙනු දැකගත හැකිය. ශේක්ෂ්පියර්ගේ ශෝකජනක සංකල්පයේ විශේෂතා වශයෙන් කථානායකයා හොඳ-නරක දෙකින්ම යුතු වීම, හොඳ මඟින් නරක වසාගෙන සිටීම, ඔහුගේ චරිත ලක්ෂණවල නියත ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ මරණයට පත් වීම, සතුරාගෙන් පලිගැනීම උදාර ගුණයක් වශයෙන් දැක්වීම යනාදිය දැකගත හැකිය. තෝමස් කයිඩ්ගේ නාටකවල වීරයන්, පෙම්වතුන්, රජුන් වෙනුවට දුක් විඳින චරිත යොදාගෙන තිබේ. ඉබ්සන්ගේ *"ඩොල්ස්හවුස්"* නාටකයේ ශොකය ජනිත කොට ඇත්තේ ද මධ්‍යම පාන්තික පවුලක් විෂයය කොට ගනිමිනි. භවභූතිගේ නාටකවලින් වීරපුරුෂයකු චිත්ත පීඩාවට පත්ව ඇද වැටීමට ලක් වන ආකාරය සාකච්ඡා කෙරේ. ජපානයේ චිකමත්සු මොන්සයිමොන්ගේ නාටකවලින් සමාජ ප්‍රශ්න හමුවේ උභතෝකෝටික භාවයට පත් වන පෙම්වතුන්-පෙම්වතියන් එකට දිවි තොර කර ගන්නා ආකාරය විදහා දැක්වේ.

ශෝකජනක නාටක ලොව පුරා පොදු ජනයාගේ දිවි පෙවෙත හා දැඩි ව බැඳී ඇති බවත්, මුල් යුගයේ රජුන් දෙවියන්, සෙන්පතියන් මුල් කොටගත් ශෝකජනක නාටක පශ්චාත්කාලීනව සාමාන්‍ය ජනතාවගේ ජීවිත විදහා දැක්වීමේ ප්‍රවණතාවකට අනුගත වූ බවත් මෙහිදී නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද** - ශෝකය, ශෝකජනක, කාරුණ්‍යය, භය*